# බහුකාර්ය මහවැලි සංවර්ධන යෝජනා ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලාංකේය සමාජ ආර්ථික සන්දර්භය තුළ ඇතිකළ බලපෑම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

*බී.එම්.සී මධුසංඛ බණ්ඩාර* [1]

ලෝක සන්දර්භය තුළ ශ්‍රී ලංකාව අතීතයේ පටන් යැපුම් කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත වූ රාජ්‍යයක් ලෙස පෙන්වාදිය හැකි ය. අතීතයේ ශ්‍රී ලංකාව පාලනය කළ හෙළ රජ දරුවන් පවා කෘෂිකර්මාන්තයේ වටිනාකම පසක් කර ගනිමින් ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් පූරණය කිරීමට ස්වකීය රාජ්‍ය අනුග්‍රහය දක්වා ඇති බවට ශ්‍රී ලංකාව පුරා විහි දී තිබෙන වාරි පද්ධතිය සහ විනාශ නොවූ කෙත් වතු කදිම සාක්ෂි සපය යි. අතීත රාජ්‍ය පාලකයන් මෙන් ම මෙරට පාලනය කළ බටහිර ජාතීන් ද දේශීය කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. එසේ ම අද්‍යතනයේ පාලන කටයුතු ගෙනයනු ලබන රාජ්‍ය පාලකයන් ද කෘෂිකර්මාන්තය සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරනු ලබන බැව් පෙනේ. සංවර්ධන යෝජනා ව්‍යාපෘති රටක සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන අතර මෙහි දී විවිධ කලාපයන්ගේ සංවර්ධනය උදෙසා විවිධ අරමුණු ඉටුකර ගැනීමේ අරමුණින් සංවර්ධන යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක කරන බැව් හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාව ගත්විට මෙහි විවිධ කලාපවල භූගෝලීය පරිස්ථිය තුළ විවිධ භූ විෂමතාවයන් දක්නට ලැබේ. එනම් ඇතැම් කලාප දියුණු තත්වයෙන් දක්නට ලැබුණ ද ඇතැම් කලාපයන්ගේ සංවර්ධනය නොවූ තත්ත්වයක් දක්නට ලැබේ. සංවර්ධන යෝජනා ව්‍යාපෘති මගින් විවිධ ප්‍රදේශ සංවර්ධනය කිරීම ඔස්සේ රටක් සංවර්ධනය සිදු කිරීම අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන යෝජනා ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර මෙලෙස ආරම්භ වූ සංවර්ධන යෝජනා ව්‍යාපෘතියක් ලෙස මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගත හැකි ය. ඒ අනුව බහුකාර්ය මහවැලි සංවර්ධන යෝජනා ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලාංකේය සමාජ ආර්ථික සන්දර්භයෙහි ලා ඇතිකළ බලපෑම කෙබඳු ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වූ අතර මහවැලි සංවර්ධන යෝජනා ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලාංකේය සමාජ ආර්ථික සන්දර්භයෙහි ලා ඇතිකළ බලපෑම් මොනවා ද යන්න පිළිබඳව හඳුනා ගැනීම මෙම පර්යේෂණය සිදු කිරීමේ මූලික අරමුණු විය. මෙම පර්යේෂණය තුළ ප්‍රස්තුත අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක දත්ත රැස්කිරීමේ පර්යේෂණ ක්‍රමවේදය යටතේ මහවැලි සංවර්ධන යෝජනා ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් ද්විතීයික සාහිත්‍යය මූලාශ්‍රයන් අධ්‍යයනය කළ අතර පුවත්පත් සඟරා සහ පුස්තකාල අධ්‍යයනයෙන් දත්ත රැස් කරගන්නා ලදී. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය තුළින් මහවැලි එච්. කලාපයේ ගොවීන්ගේ ආර්ථික සහ සමාජ තත්ත්වය සංවර්ධනය කිරීමෙහි ලා මහඟු සේවාවක් ලබා දී තිබේ. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේ දී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහයන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට සහ ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යේ දී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී. මහවැලි සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟ සතු ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 පමණ වූ ජල පරිමාණයක් විදුලි බලය නිෂ්පාදනයට සහ වාරි මාර්ග කටයුතු සඳහා සැපයීම යි. එසේ ම මෙම දැවැන්ත ව්‍යාපෘති යෝජනාව තුළින් මෙරට ජලාශ 15ක් ඉදිකර එවායෙන් ජලාශ 11ක් මූලික කොටගෙන ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීම යි. එසේ ම ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමෙහි ලා ක්‍රියාත්මක කළ විවිධ කාර්යයන් තුළ යම් යම් අහිතකර තත්ත්වයන් ද මෙම ව්‍යාපෘති යෝජනාව තුළින් හඳුනාගත හැකිවිය. මෙලෙස පර්යේෂණය තුළ දත්ත විශ්ලේෂණයේදී මූලික වශයෙන් සනාථ වන්නේ බහුකාර්ය මහවැලි සංවර්ධන යෝජනා ව්‍යාපෘතිය තුළින් ශ්‍රී ලාංකේය සමාජ ආර්ථික සන්දර්භයන් තුළ සුවිශේෂී බලපෑමක් සිදු කර තිබෙන බවත් එම බලපෑම ශ්‍රී ලාංකේය සමාජයෙහි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයෙහි ලා යහපත් සහ අයහපත් අයුරින් බලපා තිබෙන බව ය.

**මුඛය පද -** *සංවර්ධනය, ව්‍යාපෘති යෝජනාව, සමාජ ආර්ථික සන්දර්භය, විදුලි බලය, ජනාවාස*

[1] මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. madusankabandaranayaka42@gmail.com